අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ යොමුව / எனது இல. / My Ref. | ED/1/1/2/1 | ඔබේ යොමුව / உமது இல. / Your Ref. | | දිනය / திகதி / Date | 2024. 02. 09 |

**චක්‍රලේඛ අංකය: 03 / 2024**

සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම පරිවේණාධිපති හිමිවරුන්
සියලුම විදුහල්පතිවරුන්

## සමස්ත ලංකා පාසල් නර්තන තරගය - 2024

අධ්‍යාපන අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් වාර්ෂිකව පැවැත්වෙන උක්ත තරගයෙහි 2024 වර්ෂයට නියමිත කොන්දේසි, උපදෙස් සහ නිර්මාණ ඉදිරිපත් කළ යුතු ශීර්ෂ පිළිබඳ තොරතුරු මේ සමග ඇත. මේ පිළිබඳව අදාළ ගුරුභවතුන් සහ ශිෂ්‍ය-ශිෂ්‍යාවන් දැනුවත් කර මෙම තරගයට ඔවුන්ගේ නිර්මාණ ඉදිරිපත් කරවීමට කටයුතු කරන මෙන් මෙයින් දන්වමි.

වසන්තා පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

## හැඳින්වීම

දිවයිනේ සියලුම පාසල්වල නර්තන ගුරු භවතුන්ගේ හා විෂය හදාරන සිසු දරුවන්ගේ කුසලතා හා ආකල්ප සංවර්ධනය සඳහාත්, ඔවුන්ගේ ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය සඳහාත්, අධ්‍යාපන අමාත්‍යාංශය මගින් 1970 වර්ෂයේ සිට මේ දක්වා මෙම තරගය සංවිධානය කර පවත්වනු ලැබේ. මෙමගින් එක් වසරක දී සිසුන් 40,000ක් පමණ තම ප්‍රතිභාව ප්‍රදර්ශනය කරන අතර, නර්තන ගුරුභවතුන් ද තම නිර්මාණ කුසලතා වර්ධනය කර ගැනීමට මෙයින් මනා පිටුවහලක් ලබා ගනී.

වසරින් වසරට නව ක්‍රමෝපායන් උපයෝගී කර ගනිමින් පවත්වන මෙම තරගය නිසා පාසල්වල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් අර්ථවත් වන අතර, ගුරුභවතුන්ගේත් සිසුන්ගේත් සහයෝගය සහ සුහදතාව ද වර්ධනය කෙරේ. මෙයින් ජාතික මට්ටමින් ඇගැයීමට ලක් වන සිසු සිසුවියන් උසස් අධ්‍යාපනයට යොමු වීමේ දී ප්‍රමුඛතාවට පත් වේ.

## 1. සහභාගීත්වය සහ තරග තෝරා ගැනීම

- පහත අ, ආ සහ ඇ වර්ග යටතේ සියලුම රජයේ පාසල්/ පිරිවෙන් විද්‍යායතන සහ රජයේ අනුමත පෞද්ගලික පාසල්වලට ඉදිරිපත් විය හැකි ය.
- පහත 'ඇ' වර්ග යටතේ, ජාත්‍යන්තර පාසල් සහ එවැනි වෙනත් පෞද්ගලික පාසල්වලට ඉදිරිපත් විය හැකි ය.
- **සියලු තරග නිර්මාණය හා පුහුණු කරවීම් අදාළ පාසලේ ගුරුභවතුන් විසින්ම සිදු කිරීමට වග බලාගත යුතු අතර මේ සඳහා** බාහිර සම්පත් දායකයන් යොදවා ගැනීම සිදු නොකළ යුතු ය.
- කලාපීය තරගවල දී, තරග අංකයන් පුහුණු කිරීම සඳහා කලාපයේ කිසිම ගුරු උපදේශකවරයෙකුගේ සහාය ලබා නොගත යුතුය. පළාත් හා සමස්ත ලංකා තරගයන් සඳහා තම කලාපයේ ගුරු උපදේශකවරුන්ගේ සහාය ලබාගත හැකිය.
- මෙම තරගයේ කිසිඳු අවස්ථාවකට ස්වේච්ඡා ගුරුභවතුන් සහභාගී කර නොගත යුතු ය.
- ස්ථිර නර්තන ගුරුභවතුන් සේවයෙහි යෙදී සිටින පාසල් මෙම තරගය සඳහා සිසුන් සහභාගී කරවීම අනිවාර්ය වේ.

**එක් එක් කාණ්ඩයේ තරග, අදියර කිහිපයක් යටතේ පැවැත්වීමට සිදුවිය හැකි අතර දින කිහිපයකදී වුව ද තරග පැවැත්වීමට සිදුවේ. 'අ' කොටසේ A හා B කාණ්ඩ හා E කාණ්ඩය එක් දිනයකදී ද, <u>'ආ'</u> කොටසේ A හා B කාණ්ඩ එක් දිනයකදී ද, C , D හා F කාණ්ඩ** වෙනත් සති අන්තයකදී ද පැවැත්වීමට **ඉඩ ඇත. මේ පිළිබඳව විදුහල්පතිවරුන් සහ ගුරුභවතුන් අවධානය යොමු කොට ඉදිරිපත්වන තරග අංග සැලසුම් කර ගත යුතු ය.**

## 1.1. තරගය පිළිබඳ පොදු නීති රීති

තරග තෝරා ගැනීමේ දී පහත උපදෙස් පිළිපැදිය යුතු ය.

1.1.1. ශිෂ්‍ය සංඛ්‍යාව හා නර්තන අංගවල ස්වභාවය අනුව ඔබට නියමිත පාසල් වර්ගය තෝරා ගතයුතු ය.

Aesthetic Education Branch, MoE

- ශිෂ්‍ය සංඛ්‍යාව ගණනය කරනුයේ පාසලේ ක්‍රියාත්මක ප්‍රාථමික ශ්‍රේණිවල (1-5ශ්‍රේණි) සිසුන් හැර, අනෙකුත් සියලු ශ්‍රේණිවල (6-13 ශ්‍රේණි) සිටින සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව අනුව බව සැලකිල්ලට ගත යුතුය.

අ. ශිෂ්‍ය සංඛ්‍යාව 1001 ට වැඩි පාසල් (1001 ඇතුළත්ව - ප්‍රාථමික ශ්‍රේණිවල සිසුන් හැර)
ආ. ශිෂ්‍ය සංඛ්‍යාව 301 - 1000 අතර පාසල් (301 සහ 1000 ඇතුළත්ව- ප්‍රාථමික ශ්‍රේණිවල සිසුන් හැර)
ඇ. ශිෂ්‍ය සංඛ්‍යාව 300 ට අඩු පාසල් (300 ඇතුළත්ව - ප්‍රාථමික ශ්‍රේණිවල සිසුන් හැර)
ඈ. ජාත්‍යන්තර පාසල් සහ එවැනි වෙනත් පෞද්ගලික පාසල්

1.1.2 ඉදිරිපත් විය හැකි තරග කාණ්ඩ සහ තරග අංශ

| | |
|---|---|
| A කාණ්ඩයේ තරග අංශ | 6, 7, 8, 9 ශ්‍රේණි සඳහා තරග (ශිෂ්‍ය සංඛ්‍යාව 1000ට වැඩි සහ 301-1000 අතර පාසල්) |
| B කාණ්ඩයේ තරග අංශ | 10, 11, 12, 13 ශ්‍රේණි සඳහා තරග (ශිෂ්‍ය සංඛ්‍යාව 1000ට වැඩි සහ 301-1000 අතර පාසල්) |
| C කාණ්ඩයේ තරග අංශ | සිසුන් 300 ට අඩු පාසල් සඳහා තරග |
| D කාණ්ඩයේ තරග අංශ | විශේෂ තරග (සියලුම රජයේ පාසල්/ පිරිවෙන් විද්‍යායතන/ රජයේ අනුමත පෞද්ගලික පාසල්වලට විවෘතව ඉදිරිපත් විය හැකි තරග) |
| E කාණ්ඩයේ තරග අංශ | ජාත්‍යන්තර හා වෙනත් එවැනි පෞද්ගලික පාසල් සඳහා පමණක් වන තරග |
| F කාණ්ඩයේ තරග අංශ | භරත නාට්‍යම් සහ කථක් නර්තන තරගය |
| මාර්ග ගත තරග අංශය | ඉහත A,B,C,D සහ F කාණ්ඩවල ඕනෑම වයස් මට්ටමක සිසු සිසුවියන් සඳහා ඉදිරිපත් විය හැකි තරග |

1.1.3 **සිසුන් 1000ට වැඩි (1001 සිට) සහ සිසුන් 301 - 1000 අතර පාසල් පහත සඳහන් පරිදි තරග අංක තෝරා ගත යුතු ය.**

A - කාණ්ඩයෙන්/තරග අංශයෙන් ඕනෑම **එක් සමූහ තරග අංකයක් හෝ ඒකල තරග අංකයක්** ලෙස උපරිම වශයෙන් තරග අංක එකකි.

B - කාණ්ඩයෙන්/තරග අංශයෙන් සමූහ තරග අංකයක් හා ඒකල තරග අංකයක් ලෙස හෝ සමූහ තරග අංකයක් පමණක් ලෙස නැතහොත් එක් ඒකල තරග අංකයක් පමණක් ලෙස උපරිම වශයෙන් තරග අංක දෙකකි.

D - කාණ්ඩයෙන්/තරග අංශයෙන් උපරිම වශයෙන් තරග අංක **දෙකකි** (ශිෂ්‍ය සංඛ්‍යාව 1000ට වැඩි, 301-1000 හා 300ට අඩු වශයෙන් බෙදා වෙන් නොකෙරේ).

F - කාණ්ඩයෙන්/තරග අංශයෙන් උපරිම වශයෙන් තරග අංක **දෙකකි** (ශිෂ්‍ය සංඛ්‍යාව 1000ට වැඩි, 301-1000 හා 300ට අඩු වශයෙන් බෙදා වෙන් නොකෙරේ).

මාර්ග ගත තරග අංශයෙන් - ඉහත A, B, C, D සහ F කාණ්ඩය හැර, කාණ්ඩවල ඕනෑම පාසලක සිසු සිසුවියන්ට ඉදිරිපත් විය හැකි අතර එක් පාසලකින් සිසු සිසුවියන් කිහිප දෙනෙකුට වුව ද ඉදිරිපත් විය හැකිය. තරග කොන්දේසි තරග ශීර්ෂයට පහළින් දක්වා ඇත.

Aesthetic Education Branch, MoE

1.1.4. **සිසුන් 300ට අඩු පාසල් පහත සඳහන් පරිදි තරග අංක තෝරා ගතයුතු ය.**

C - කාණ්ඩයේ තරග අංකවලින් උපරිම වශයෙන් ඕනෑම තරග අංක 03ක් සඳහා ඉදිරිපත්විය හැකි ය.

D - කාණ්ඩයෙන් උපරිම වශයෙන් තරග අංක **දෙකකි** (ශිෂ්‍ය සංඛ්‍යාව 1000ට වැඩි, 301-1000 හා 300ට අඩු වශයෙන් බෙදා වෙන් නොකෙරේ).

F - කාණ්ඩයෙන් උපරිම වශයෙන් තරග අංක **දෙකකි** (ශිෂ්‍ය සංඛ්‍යාව 1000ට වැඩි, 301-1000 හා 300ට අඩු වශයෙන් බෙදා වෙන් නොකෙරේ).

1.1.5. ජාත්‍යන්තර පාසල් සහ වෙනත් එවැනි පෞද්ගලික පාසල් පහත සඳහන් පරිදි තරග අංක තෝරාගත යුතු ය.

D - කාණ්ඩයෙන් උපරිම වශයෙන් තරග අංක එකකට සහභාගී විය හැකි ය.
E - කාණ්ඩය යටතේ තරග අංක එකකට පමණක් ඉදිරිපත් විය හැකි ය.
F - කාණ්ඩයේ තරග අංක සඳහා ඉදිරිපත් විය නොහැකි ය.

1.1.6. **2023 වර්ෂයේ දී සමස්ත ලංකා පාසල් නර්තන තරගයේ ගැහැණු, පිරිමි, මිශ්‍ර වශයෙන්, උඩරට, පහතරට සහ සබරගමු නර්තන අංගයන් සඳහා ඒකල හෝ සමූහ තරගවල ප්‍රථම ස්ථානය ලැබූ සහ ගැමි නැටුම්, නිර්මාණාත්මක නැටුම්, චරිත නිරූපණ හා බෙර වාදන, ඒකල හෝ සමූහ තරගවල - භරත නාට්‍යම් හා කථක් නර්තන තරග, ගොක්කෙළ නිර්මාණ, කඩිප්පු නිර්මාණ, ශීර්ෂාභරණ නිර්මාණ, මංගල පෝරු සැරසිලි හා චාරිත්‍ර වශයෙන් (2023 සමස්ත ලංකා පාසල් නර්තන තරග චක්‍රලේඛයේ සියලුම තරග) සඳහා ඉදිරිපත්ව ප්‍රථම ස්ථාන ලබාගත් කිසිම පාසලකට 2024 වර්ෂයේ දී එම තරග ශීර්ෂයටම ඉදිරිපත් විය නොහැකි ය. වෙනත් තරගයකට ඉදිරිපත් විය හැකිය.**

උදා 1: ගැහැණු - සමූහ - ගැමි නැටුම් නිර්මාණ තරගයට 2023 වර්ෂයේ ඉදිරිපත් වූ පාසලකට, 2024 වර්ෂයේ දී ගැහැණු - සමූහ - ගැමි/නිර්මාණ තරගයට ඉදිරිපත් විය නොහැකි අතර, පිරිමි - සමූහ -ගැමි/නිර්මාණ තරගයට හෝ මිශ්‍ර - සමූහ - ගැමි/නිර්මාණ තරගයට ඉදිරිපත් විය හැකි ය.

උදා 2: 6, 7, 8 සහ 9 ශ්‍රේණි සඳහා ගැහැණු - සමූහ - උඩරට - උකුසා වන්නම සඳහා 2023 වර්ෂයේ ඉදිරිපත් වූ පාසලකට, 2024 වර්ෂයේ දී එම ශ්‍රේණි සඳහා ගැහැණු - සමූහ - උඩරට - උදාර වන්නම තරගයට ඉදිරිපත් විය නොහැකි ය. ඔවුන්ට එම ශ්‍රේණි සඳහා පිරිමි-සමූහ උඩරට /මිශ්‍ර-සමූහ-උඩරට හෝ වෙනත් සම්ප්‍රදායකට ඉදිරිපත් විය හැකිය. තවද 10 - 13 ශ්‍රේණි තරග අංක සඳහා ද ඉදිරිපත් විය හැකි ය.

Aesthetic Education Branch MoE

**තරග අංක සඳහා සහභාගී විය හැකි ගුරු/ සිසු සංඛ්‍යාවන් පිළිබඳ උපදෙස්**

1.2.1. සියලුම ඒකල සහ යුගල නර්තන තරග අංක සඳහා නර්තනයට හැර සහාය වාදන සහ ගායනය සඳහා සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව 05කි; නර්තනයෙන් සහභාගිවන්නා සමග 06 දෙනෙකි.

1.2.2. සියලුම සමූහ නර්තන අංග සඳහා නර්තනයෙන් සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව 16ක් වන අතර එම අංගයේ සහාය ගායනට සහ වාදනයට සහභාගී විය හැකි සංඛ්‍යාව 08කි. නර්තන අංගයේ සමස්ත සහභාගීත්වය උපරිමය 24කි. D කාණ්ඩයේ තරගවල දී මෙම සංඛ්‍යා වෙනස් විය හැකි අතර එවැනි අවස්ථාවල අදාළ තරග අංකයට පහළින් දක්වා ඇත.

1.2.3. ඒකල සහ යුගල වාදන තරග අංක සඳහා සහාය විය හැක්කේ එක් තාලම්පට වාදකයෙකුට පමණි. හක්ගෙඩිය භාවිත කරන්නේ නම් තාලම්පට වාදකයා විසින්ම එය සිදු කළ යුතු ය.

1.2.4. සිසුන් 300ට අඩු පාසල්වලින් ඉදිරිපත්වන මිශ්‍ර තරග අංක සඳහා සිසු සිසුවියන් අවම වශයෙන් එක් වර්ගයකින් 03 දෙනෙකුවත් සිටීම අනිවාර්ය වේ.

1.2.5. සිසුන් 301-1000 සහ 1001ට වැඩි පාසල් තරග අංක සඳහා සහභාගී වීමේ දී, මිශ්‍ර සමූහ නර්තන අංක සඳහා **නර්තනයෙන්** ගැහැණු - පිරිමි සමාන සංඛ්‍යාවන්ගෙන් යුතුව ඉදිරිපත් වීම අනිවාර්ය වේ.

## 1.2. <u>වාදන සහාය</u>

i. **A සිට F දක්වා වන සියලු කාණ්ඩවල පාසල්වලින් ඉදිරිපත් වන නර්තන තරග අංක සඳහා සහාය වාදනය අදාළ පාසලේ සිසු සිසුවියන් විසින්ම ඉදිරිපත් කළ යුතු ය.**

ii. **ශිෂ්‍ය සංඛ්‍යාව 301-1000 සහ ශිෂ්‍ය සංඛ්‍යාව 1001ට වැඩි පාසල්වලින්** ඉදිරිපත් කරන, පිරිමි නර්තන තරග අංක සඳහා සහාය වාදනයෙන් **පිරිමි ළමුන් පමණක්** ද, ගැහැණු නර්තන තරග අංක සඳහා සහාය වාදනයෙන් **ගැහැණු ළමුන් පමණක්** ද, සහභාගී විය යුතු ය. මිශ්‍ර නර්තන තරග අංක සඳහා **බෙර වාදනයෙන් සහාය වීමේ දී** පමණක් ශිෂ්‍ය ශිෂ්‍යාවන් දෙවර්ගයම මිශ්‍ර වශයෙන් සහභාගී විය යුතු ය.

iii. **ශිෂ්‍ය සංඛ්‍යාව 300ට අඩු පාසල් සහ E කාණ්ඩයට අයත් පාසල් සඳහා සහය වාදනයේ දී, ගැහැණු - පිරිමි භේදයකින් තොරව වාදනයෙන් සහභාගී විය හැක.**

## 1.3. <u>ගායන සහාය</u>

1.3.1. පිරිමි තරග අංග සඳහා ශිෂ්‍යයන් පමණක් ද, ගැහැණු තරග අංග සඳහා ශිෂ්‍යාවන් පමණක් ද, මිශ්‍ර තරග අංග සඳහා මිශ්‍ර වශයෙන් ද ගායනය සඳහා සහභාගී විය යුතු ය.

1.3.2. ගායනයෙන් සහභාගී වන සියලු ම ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් ඒ ඒ තරග අංගවලට **අදාළ ශ්‍රේණිවල ම** විය යුතු ය.

1.3.3. කිසිදු විටෙක A සිට F දක්වා වන සියලු කාණ්ඩවලට අයත් තරග අංක සඳහා ගුරුවරුන්ට ගායනයෙන් සහාය විය නොහැකි ය.

# 2. <u>අදාළ වෙනත් කරුණු</u>

## 2.1. <u>අයදුම්පත් යොමු කිරීම</u>

2.1.1 තරගය සඳහා ඉදිරිපත් වීමේ දී මෙම චක්‍රලේඛයේ අංක 02 ඇමුණුම අනුව සකස් කරන ලද අයදුම්පත් භාවිත කළ යුතු ය. **සහභාගී වන සෑම ශිෂ්‍යයෙක් ම විදුහල්පති ඉදිරියේ එක් තීරුවක අත්සන් කළ යුතු අතර, අනෙක් තීරුව තරග සංවිධායක මණ්ඩලය ඉදිරියේ අත්සන් කිරීමට ඉඩ තැබිය යුතු ය.** විදුහල්පති විසින් සහතික කරන ලද උප්පැන්න සහතිකයේ පිටපතක් ද, විදුහල්පති විසින් සහතික කරන ලද ඡායාරූපයක් හෝ වලංගු හැඳුනුම්පතක් ද ඉදිරිපත් කළ යුතු ය.

Aesthetic Education Branch MOE

2.1.2 ඉල්ලුම් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී යතුරු ලියනය නොකරන්නේ නම්, ඉතා පැහැදිලි අත් අකුරින් සම්පූර්ණ කිරීම අත්‍යවශ්‍ය වේ. අයදුම්පතෙහි පාසලේ නම සහ මුලකුරු සමඟ නම ඉංග්‍රීසි අකුරින් ලිවිය යුතු ය.

(උදා: WP/GM/Bandaranayaka M.M.Vidyalaya).

2.1.3 සෑම තරග අවස්ථාවක් සඳහා ම අංග සම්පූර්ණ ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතු වේ. යම් පාසලක් තරග ශීර්ෂ කිහිපයකට ඉල්ලුම් කිරීමේ දී, එක් තරග ශීර්ෂයකට එක බැගින් පමණක් වෙන වෙන ම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය. නාම ලේඛන සකස් කිරීමේ දී අදාළ ගුරුභවතාගේ නමට ඉදිරියෙන් මෙය/ මිය/ මයා වශයෙන් ද අනිවාර්යයෙන්ම සටහන් කළ යුතු ය.

2.1.4. අවසාන තරගයට ඉදිරිපත් වීමේ දී ඉල්ලුම්පත්‍රය රැගෙන ආ යුතු ය.

2.1.5. **මාර්ගගත තරග අංශය සඳහා** ඉදිරිපත් වන පාසල් තම අයදුම්පත් **2024 අප්‍රේල් මස 10 දිනට ප්‍රථම** පහත සඳහන් ලිපිනයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය ශාඛාව වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **''සමස්ත ලංකා පාසල් නර්තන තරගය - 2024 - මාර්ගගත තරග අංශය''** යනුවෙන් තරග ශීර්ෂ අංකය ද සහිතව සඳහන් කළ යුතු වේ.

ලිපිනය: අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞන්දර්ය), සෞන්දර්ය අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.

Aesthetic Education Branch, MoE

2.1.6. තමන් අයදුම් කළ යුතු නිවැරදි තරග අංකයට අයදුම් කිරීමේ පූර්ණ වගකීම අදාළ පාසල සතු ය. වැරදි තරග අංකයකට අයදුම් කර, එය කලාප හෝ පළාත් තරගයෙන් ඊට ඉහළ මට්ටමට ඉදිරිපත් කිරීමට නියමිතව පැවැතිය ද, එම දෝෂය අනාවරණය වූ පසුව, එය එම තරග මට්ටමට (එනම් පළාත් හෝ අවසාන) ඉදිරිපත් නොකළ යුතු ය.

## 2.2. <u>වෙනත් උපදෙස්</u>

2.2.1. යම් තරගකරුවෙකු කලාප තරගය සඳහා ඉදිරිපත් වී ජයග්‍රහණය කළ පසු වෙනත් පාසලකට ඇතුලත් වුවහොත් අදාළ වර්ෂයේ පළාත් සහ සමස්ත ලංකා තරග සඳහා ඉදිරිපත් විය යුත්තේ කලාප තරග සඳහා නියෝජනය කළ පාසලෙන් පමණි.

2.2.2. 2024 වර්ෂයේ මෙම තරගයේ කලාප තරග සඳහා ඉදිරිපත්වන විට, පහත සඳහන් පරිදි අ.පො.ස. (සා.පෙළ), අ.පො.ස. (උ.පෙළ) විභාගවලට දෙවන වර පෙනී සිටීමට අපේක්ෂිත සිසු සිසුවියන්ට සහ එම විභාගවලට සහ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ඉදිරිපත් වීමට නියමිත සිසුවියන්ට ද සහභාගී විය හැකිය.

- පළමු වර 2024 (2023) වර්ෂය
- දෙවන වර 2023 (2022) වර්ෂය

2.2.3. රංග භාණ්ඩ සංඛ්‍යාවන් පිළිබඳ සීමාවක් නොමැත. පන්දම් දල්වා භාවිත නොකළ යුතු ය.

2.2.4. සියලු ම නර්තන අංක සඳහා වේදිකා පසුතල නිර්මාණ තහනම් ය. (නර්තනයේ දී අතට ගෙන භාවිත කරන කිසිදු උපකරණයක් පසුතල නිර්මාණයක් ලෙස නොගත යුතුය).

2.2.5. නිර්මාණකරුට අවශ්‍ය ඕනෑ ම අවස්ථාවක දී හක්ගෙඩිය භාවිත කළ හැකි ය.

**2.2.6. මෙම සියලු තරග නීති පිළිබඳ ගුරු භවතුන් දැනුවත් කිරීම හා එම නීති රීති උල්ලංඝනය නොවන පරිදි තම කලාපයට/පළාතට අයත් පාසල් තරගය සඳහා ඉදිරිපත් කරවීමට කලාපයේ/ පළාතේ සෞන්දර්ය අධ්‍යක්ෂ කටයුතු කළ යුතුය.**

## 2.3. <u>තරග අංක සඳහා කාලය</u>

තරග අංකයන්ට පහළින් සඳහන් කර නොමැති අංග හැර අනෙක් සියලු තරග අංක සඳහා පහත උපදෙස් පිළිපැදිය යුතු ය.

2.3.1. ඒකල සහ යුගල තරග සඳහා උපරිම කාලය විනාඩි 05ක් වේ.
2.3.2. සමූහ තරග සඳහා උපරිම කාලය විනාඩි 06ක් වේ.
2.3.3 අමතර සමා කාලය තත්පර 45ක් වේ.

## 2.4. <u>තරගකරුවන්ගේ ඇඳුම් පැළඳුම්</u>

තරග අංකයන්ට පහළින් සඳහන් කර නොමැති අංග හැර අනෙක් සියලු තරග අංක සඳහා පහත උපදෙස් පිළිපැදිය යුතු ය.

Aesthetic Education Branch, MoE

2.4.1. කලාප, පළාත් සහ සමස්ත ලංකා අවසන් තරගයේ දී සමූහ තරග අංක සඳහා පුහුණු ඇඳුම් කට්ටලයෙන් පමණක් ඉදිරිපත් විය යුතු ය.

2.4.2. සමස්ත ලංකා අවසන් තරගයේ දී පමණක්,

- ඒකල සියලු ම තරග අංකයන්හි නර්තන ඉදිරිපත් කරන්නා සඳහා පමණක් සාම්ප්‍රදායික ඇඳුමක් භාවිත කළ හැකි ය.
- ඒ සඳහා ගායනයෙන් හා වාදනයෙන් සහාය වන කිසිවෙක් සාම්ප්‍රදායික ඇඳුම් භාවිත නොකළ යුතු ය (ඇඳුම් පැළඳුම් භාවිත කළ යුතු අංග, එම තරග ශීර්ෂය යටතේ දක්වා ඇත).
- පළාත් සහ සමස්ත ලංකා අවසන් තරග සඳහා ශිෂ්‍යාවන්ගේ සාය සහ හැට්ටය තනි වර්ණයෙන් සමන්විත විය යුතු අතර, කළු පැහැති පිජාමා කලිසම භාවිත කළ යුතු ය (ලියෝටාඩ් භාවිත කරන්නේ නම් කළු පැහැයෙන් විය යුතු ය).
- පළාත් සහ සමස්ත ලංකා අවසන් තරග සඳහා ශිෂ්‍යයින් කළු පැහැති අත් රහිත බැනියම (ස්කිනියර්) සහ දණහිස දක්වා උසින් යුක්ත ඉණට අඳින කෙටි තනිපාට රෙද්ද සමඟ කළු පිජාමා කලිසම ද භාවිත කළ යුතු ය.

2.4.3. සහාය ගායනය/සහාය වාදනය සඳහා සහභාගී වන සිසුන් පුහුණු ඇඳුම් කට්ටලයෙන් හෝ සුදුසු පහසු ඇඳුමකින් සැරසීම ප්‍රමාණවත් ය. පාසලේ අනන්‍යතාව ප්‍රදර්ශනය වන ආකාරයේ කිසිවක් භාවිත නොකළ යුතු ය. කලාප තරග සඳහා මෙය අදාළ නැත.

2.4.4. කලාප සහ පළාත් තරග අවස්ථාවන්හි දී ඇඳුම් සම්බන්ධයෙන් කිසියම් ගැටලුවක් මතු වුවහොත් ඒ පිළිබඳව තීරණ ගැනීම, අදාළ කලාප/පළාත් නර්තන විෂය භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ නිර්දේශ මත කලාප/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සිදු කළ යුතු ය.

## 3. කලාප/ පළාත් තරග සංවිධානය

3.1. කලාප තරගයට අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් තම කලාපයේ සෞන්දර්ය/නර්තන විෂය භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ නර්තන ගුරු උපදේශකගේ සහාය ඇතිව තරගය සංවිධානය කළ යුතු වේ. කලාප තරගයේ සියලු වගකීම් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත පැවරෙන අතර, ඔහු/ඇය මෙම උපදෙස් සංග්‍රහය උල්ලංඝනය නොවන පරිදි කලාප තරග ප්‍රතිඵලවල අවසන් තීරක ද වේ.

**කලාප තරග පවත්වා, පළාත් තරග සංවිධානය සඳහා අදාළ ප්‍රතිඵල ලේඛන පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත 2024 අප්‍රේල් 10 දින වන විට ඉදිරිපත් කළ යුතු ය.**

3.2. පළාත් තරගය අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සංවිධානය කළ යුතු ය. මෙම කටයුතුවල දී පළාතේ නර්තන විෂය භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂට සහාය විය යුතු ය. අවශ්‍ය අවස්ථාවල දී පමණක් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යාපන අධ්‍යක්ෂගේ එකඟතාව සහිතව එම පළාතට අයත් සෞන්දර්ය විෂයය භාර නිලධාරියකු, සම්බන්ධීකරණ/සංවිධායක නිලධාරියා වශයෙන් නම් කෙරෙනු ඇත. පළාත් තරගයේ සියලු ම වගකීම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත පැවරෙන අතර මෙම උපදෙස් සංග්‍රහය උල්ලංඝනය නොවන පරිදි ඔහු/ඇය පළාත් තරග ප්‍රතිඵලවල අවසන් තීරක ද වේ. යම් විෂයානුබද්ධ ගැටලු අවස්ථාවක පළාතේ අදාළ විෂය භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශ සහිතව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අදාළ තීරණ ගත යුතු ය.

- **පළාත් තරග පවත්වා අවසාන තරග සංවිධානය සඳහා ප්‍රතිඵල ලේඛන අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත 2024 ජූනි 30 දින වන විට එවිය යුතු ය.**
- **අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය ශාඛාවෙන් සකසා ලබා දෙන Google ෆෝරමයට පළාත් පළාත් ප්‍රතිඵල සිංහල යුනිකෝඩ් අක්ෂරයකින් ඇතුළත් කර එවිය යුතු අතර ම පළාත් තරග ප්‍රතිඵල ලේඛනයේ PDF පිටපතක් අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය ශාඛාවේ aestheticeducation.moe.lk@gmail.com යන ඊ මේල් ලිපිනයට ද එවිය යුතුය.**
- **පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ සහතික කළ ප්‍රතිඵල ලේඛනය ලියාපදිංචි තැපෑලෙන් හෝ පැමිණ හෝ ලබා දිය යුතු ය.**

Aesthetic Education Branch, MoE

3.3. කලාප මට්ටමට පෙනී සිට ජයග්‍රහණය කළ සිසු-සිසුවියන් ම පළාත් මට්ටමට ද, පළාත් මට්ටමට පෙනී සිට ජයග්‍රහණය කළ සිසු-සිසුවියන්ම ජාතික මට්ටමට ද පෙනී සිටීම අනිවාර්ය වේ. මේ සම්බන්ධයෙන් නොවැළැක්විය හැකි යම් ගැටලුවක් මතු වුවහොත්, පාසලේ විදුහල්පතිගේ නිර්දේශ මත කලාප තරග මට්ටමේ දී කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේත්, පළාත් තරග මට්ටමේ දී පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේත්, සමස්ත ලංකා තරග මට්ටමේ දී අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය මත පමණක් එම ගැටලුව නිරාකරණය කර ගත යුතු ය.

3.4. යම් තරග ශීර්ෂයකින් කලාප තරගයකට ඉදිරිපත් නො වූ කිසිදු පාසලක් පළාත් තරග අවස්ථාවට සහභාගී නොකිරීමටත්, පළාත් තරග අවස්ථාවට සහභාගී නො වූ පාසලක් අවසන් මහා තරගය සඳහා ඉදිරිපත් නොකිරීමටත්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ඇතුළු අදාළ විෂය භාර නිලධාරීන්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, පළාත් සෞන්දර්ය අධ්‍යක්ෂ/ සම්බන්ධීකරණ නිලධාරී වග බලා ගත යුතු ය.

3.5. කලාප/පළාත් තරගවල දී කුමන හේතුවක් නිසා හෝ සම ස්ථාන ලබා නොදිය යුතු ය. එක් තරග ශීර්ෂයකින් ජාතික මට්ටමට නිර්දේශ කළ යුත්තේ එක් පාසලක් පමණි. මෙහි පූර්ණ වගකීම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ සතු වේ. සමස්ත ලංකා තරගයට කැඳවනු ලබන්නේ පළාත් මට්ටමේ තරගයෙන් ප්‍රථම ස්ථානය ජයග්‍රහණය කළ පාසල් පමණි. මෙම කොන්දේසිවලට පරිබාහිර අවස්ථා ඒවා අදාළ ශීර්ෂ යටතේ දක්වා ඇත.

3.6. කලාප/පළාත් තරග පැවැත්වීම පිළිබඳ අධීක්ෂණය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරියෙකුට හා කලාප තරග පැවැත්වීම පිළිබඳ අධීක්ෂණය සඳහා අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නම් කරන ලද නිලධාරියෙකු සහභාගී විය හැකි ය.

## 4. <u>තරග විනිශ්චය හා ප්‍රතිඵල</u>

4.1. කලාප තරග විනිශ්චය සඳහා විනිශ්චය මණ්ඩලය අදාළ කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද, පළාත් තරග විනිශ්චය කටයුතු සඳහා වන විනිශ්චය මණ්ඩලය අදාළ පළාතේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ද, තම කලාප/පළාත් සෞන්දර්ය හෝ නර්තන විෂය භාර නිලධාරී නිර්දේශ මත පත් කළ යුතු ය. අවසන් තරගයේ විනිශ්චය මණ්ඩලය පත් කෙරෙන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයේ නර්තන විෂය භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය අධ්‍යාපන අධ්‍යක්ෂ විසිනි. එමෙන්ම යම් තරග ශීර්ෂයක විෂයානුබද්ධ ගැටලුවක් මතු වී ඇති විටෙක, ඒ පිළිබඳව යම් තීරණයක් ගත යුතු යැයි හැඟේනම් පමණක්, අධ්‍යාපන ලේකම්ගේ එකඟතාව මත විනිශ්චය මණ්ඩලය සමඟ සාකච්ඡා කර තීරණයක් ගැනීම සිදු වේ.

4.2. කලාප/පළාත් තරග සඳහා සුදුසු විනිශ්චය මණ්ඩල නිර්දේශ කිරීම අදාළ කලාපයේ/පළාතේ සෞන්දර්ය හෝ නර්තන විෂය භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂගේ වගකීම වන අතර **මේ සඳහා සේවයේ යෙදී සිටින ගුරුවරුන් යොදා නොගත යුතු ය.** විනිශ්චය ලබා දීමේ දී අපක්ෂපාතීව, වගකීම් සහගතව සහ පරිණතභාවයෙන් යුතුව එහි නිරත විය හැකි ප්‍රවීණයන් ඒ සඳහා නිර්දේශ කිරීමත්, තරග කොන්දේසි හා නීති ඇතුළු අදාළ අනෙකුත් කරුණු පිළිබඳව විනිශ්චය මණ්ඩලය මැනවින් දැනුවත් කිරීමත් අදාළ කලාපයේ/පළාතේ සෞන්දර්ය හෝ නර්තන විෂය භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂගේ එම වගකීමට ඇතුළත් ය.

4.3. අදාළ තරග අවස්ථාවෙන් පසුව සියලු ම විනිශ්චය සටහන් පත්‍රිකා අදාළ කලාප/පළාත් අධ්‍යක්ෂගේ අත්සන සහිතව සුරැකිව තබා ගැනීම කලාපයේ/පළාතේ සෞන්දර්ය/නර්තන විෂයය භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂගේ වගකීම වේ. තරගයෙන් පසුව ඊට සම්බන්ධ වූ යම් පාසලක් කලාප/ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිරීක්ෂණයට ඉල්ලා සිටියහොත්, තරග ශීර්ෂයට අදාළ එම සටහන් නිරීක්ෂණයට ඉඩ ලබා දිය යුතු ය.

4.4. තරගයේ දී කිසියම් ඒකල හෝ සමූහ තරග ශීර්ෂයකට තරග වදින කණ්ඩායම් සියල්ල හෝ කිහිපයක් හෝ එකක් හෝ අවශ්‍ය සාධන මට්ටම, එනම් ලකුණු 40ක් වන අවම සාධන ලකුණු මට්ටම ඉක්මවා නැති බව විනිශ්චය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අවස්ථාවක දී එම කණ්ඩායමට හෝ කණ්ඩායම්වලට ජයග්‍රහණය ලබා නොදෙනු ඇත.

4.5. කලාප/පළාත් හා ජාතික තරගය පවත්වන දිනයේ දී ම අදාළ තරග ශීර්ෂයන්හි ප්‍රතිඵල නිකුත් කරනු ලැබේ. යම් ආකාරයකින් මේ සම්බන්ධයෙන් කිසියම් ගැටලුවක් පැන නැඟී ඇති විටෙක, අදාළ පරීක්ෂණවලින් පසුව එම ප්‍රතිඵල නිකුත් කෙරේ. සමස්ත තරග මාලාවෙහි තරග අවස්ථාවන්හි දී විනිශ්චයන් සම්බන්ධව විනිශ්චය මණ්ඩලය සමඟ කරුණු සාකච්ඡා කිරීමට තරගකරුවන්ට හෝ ගුරුභවතුන්ට අවස්ථාවක් නොලැබේ.

Aesthetic Education Branch, MoE

4.6. තරගයේ කිසියම් අදියරක දී, ඊට සම්බන්ධ යම් පාර්ශවයක් යම්කිසි වංචනික ක්‍රියාවක නිරත වීම මගින් හෝ වෙනත් ආකාරයකින් තරග ප්‍රතිඵලවලට බලපෑමක් වන අයුරින් තරගයට ඉදිරිපත් වී ඇති බවට කවර හෝ අවස්ථාවක දී වුව ද අනාවරණය වුවහොත් සහ එය පිළිගත හැකි සහ වගකීම් සහගත අනාවරණයක් නම් ඒ පිළිබඳව පරීක්ෂා කර අවශ්‍ය පියවර ගනු ලැබේ. එහි දී යම් තරග ශීර්ෂයක ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසුව වුව ද, චෝදනාවේ බරපතලකම අනුව අදාළ පාසල එම තරග ශීර්ෂයෙන් ඉවත් කරන්නේ නම් ඊ ළඟ ඉහළ ම ලකුණු මට්ටම ලබාගත් පාසලට ජයග්‍රහණ අවස්ථා පිළිවෙලින් හිමි වේ.

4.7. ගැටලු සහගත තත්වයක් නොමැති සෑම අවස්ථාවක ම තරග ප්‍රතිඵල අදාළ දිනයේ දී ම ප්‍රකාශ කෙරේ.

4.8. සමස්ත ලංකා තරගයට යොමුකිරීමට, පළාත් මට්ටමේ තරගයෙන් අවම වශයෙන් ලකුණු 50ක් ලබා තිබිය යුතු ය.

4.9. සමස්ත ලංකා මට්ටම හෙවත් අවසාන තරගයට ඉදිරිපත් වන පාසල් සඳහා ලබා දෙන තරග කාල සටහන් ගොනුවෙහි අමුණා ඇති ප්‍රකාශය හොඳින් කියවා තේරුම් ගෙන විදුහල්පති විසින් අදාළ ස්ථානයෙහි අත්සන් යොදා තම විදුහල තරගයට ඉදිරිපත් කරවිය යුතු ය.

4.10. සමස්ත ලංකා තරගයේ දී ප්‍රථම, දෙවන සහ තෙවන ස්ථාන හිමි වන අතර, ලකුණු 70ට වැඩි අනෙකුත් පාසල් තිබේ නම් ඒ සඳහා විශිෂ්ට සම්මාන ද, ලකුණු 50ට වැඩි අනෙකුත් පාසල් තිබේ නම් ඒ සඳහා කුසලතා සම්මාන ද හිමි වේ.

4.11. තරග අංක 100, 101, 102, 103, 104, 105, 106, 107, 111, 112, 113, 114 සහ 115 හි පමණක් කලාප මට්ටමේ ප්‍රථම සහ දෙවන ස්ථාන පළාත් තරගය සඳහා ද, පළාත් මට්ටමේ ප්‍රථම සහ දෙවන ස්ථාන සමස්ත ලංකා තරගය සඳහා ද ඉදිරිපත් කළ යුතු ය.

## 5. සහතික පත්‍ර ලබා දීම

5.1. කලාප හා පළාත් මට්ටමේ තරගවලින් ජයග්‍රහණය ලබා ගන්නා සිසුන්ට සහතික පත්‍ර පිරිනැමීම කලාප හා පළාත් මට්ටමින් සිදු කළ යුතු වේ. ජාතික මට්ටමේ ජයග්‍රාහකයින් සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සහතික පත්‍ර පිරිනමනු ලැබේ.

## 6. විනය සහ වගවීම - පිළිබඳ අදහස්

6.1. එක් එක් තරග අවස්ථාවට සහභාගී වීමට තරග මධ්‍යස්ථානවලට සහ නේවාසික මධ්‍යස්ථානවලට පැමිණෙන සිසුන්ගේ විනය, හැසිරීම, ආරක්ෂාව හා භාරකාරත්වය පිළිබඳව විදුහල්පතිවරුන්ගේ සහ කණ්ඩායම් භාර ගුරු මහත්ම මහත්මීන්ගේ විශේෂ අවධානය යොමු විය යුතු ය.

6.2. ශිෂ්‍යාවන්ගේ භාරකාරත්වය ගුරු මහත්මීන්ට ද, ශිෂ්‍යයින්ගේ භාරකාරත්වය ගුරු මහත්වරුන්ට ද, පැවරිය යුතු ය. ශිෂ්‍යයින් හා ශිෂ්‍යාවන් යන දෙපිරිස ම සහභාගී වන විට ගුරුමහත්මීන් සහ ගුරුමහත්වරුන් යන දෙපාර්ශවයට ම භාරකාරත්වය පැවරිය යුතු ය.

6.3. කිසියම් අයථා සිදුවීමක් සිදුවුවහොත් ඒ සඳහා භාරකරුවන් වගකීමට බැඳේ. තරගය හා සම්බන්ධ කිසිදු අවස්ථාවක් සඳහා දෙමාපියන් සහ වෙනත් සුබපතන්නන්/පාර්ශවකරුවන් සහභාගි කර නොගත යුතු අතර මේ පිළිබඳව විදුහල්පති වගකීමට බැඳේ.

Aesthetic Education Branch, MoE

6.4. මෙම තරගයේ සෑම අවස්ථාවක දීම යම් විදුහලක් ආශ්‍රිතව මීට අදාළ සෑම කටයුත්තක්ම සිදු විය යුත්තේ අදාළ විදුහලේ විදුහල්පති, කලාප හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවෙන් එහි සෞන්දර්ය අධ්‍යාපන අධ්‍යක්ෂ අතර පමණි. තම පාසලේ වෙනත් පාර්ශවයන් එම කටයුතුවලට මැදිහත් කර නොගැනීමේ වගකීම ද අදාළ පාසලේ විදුහල්පතිවරයා වෙත සෘජුව ම පැවරේ.

6 5. කිසිදු හේතුවක් මත පාසලකට මෙම උපදෙස් පරිශීලනය කිරීමට නොහැකි වීම හෝ නොකිරීම නිදහසට කරුණක් නොවන අතර, ඉන් සිසුනට සිදුවිය හැකි හානි, නොසැලකිලිමත් බවේ හා වගකීම් විරහිත බවේ ප්‍රතිඵල ලෙස සලකා ඊට වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව අදාළ විනයානුකූල පියවර ගනු ලැබේ.

6.6. තරගයට සහභාගීවන්නන්ගේ, පාර්ශවකරුවන්ගේ, සිසුන්ගේ ගුරු භවතුන්ගේ, නිලධාරීන්ගේ, තරග විනිසුරුවන්ගේ මෙන්ම පාසල් සහ අධ්‍යාපන ආයතනයන්හි පෞරුෂයට, ප්‍රතිරූපයට සහ ගෞරවයට හානිදායක වන සහ අගතියට පත්වන දේ සිදු කරමින් ලිඛිතව, වාචිකව හෝ මාධ්‍ය භාවිතයෙන් හෝ කටයුතු කරන්නන්ට විරුද්ධව නීත්‍යානුකූලව පියවර ගනු ලැබේ.

6.7. අදාළ පාසලේ විදුහල්පති, ගුරු භවතුන් සහ තරග අංක සඳහා සහභාගී වන සිසුන්ට පමණක් තරග මධ්‍යස්ථානය වෙත ඇතුළුවීමට අවසර ඇත. දෙමාපියන් හා සුබපතන්නන් ඇතුළුවීම සපුරා තහනම්ය.

6.8. මෙම තරග චක්‍රලේඛයෙහි දක්වා ඇති වගන්ති හා සීමාවන් එකකට හෝ කිහිපයකට පටහැනිව කටයුතු කොට ඇති බව අනාවරණය වුවහොත් තරගයේ කුමන අවස්ථාවක වුව ද ප්‍රතිඵල ලේඛණවලින් එම විදුහල ඉවත් කිරීම, සහතික අවලංගු කිරීම සහ විනයානුකූල පියවර ගැනීම ඇතුළු අදාළ වෙනත් තීරණ ගැනීම අධ්‍යාපන අමාත්‍යාංශය සතුවේ.

6 9. තරගයට ඉදිරිපත් වන ගුරුභවතුන් කිසි විටක විනිශ්චය මණ්ඩලය සමඟ සාකච්ඡා කිරීම තහනම් වන අතර, මේ පිළිබඳ සංවිධායක විමසිලිමත්ව කටයුතු කළ යුතුය.

6.10. ගුරු ආචාර ධර්ම, සිසුන්ගේ ආචාර ධර්ම පද්ධතියට හෝ නිලධාරීන්ගේ වගකීම්වලට අනුකූල වන ලෙස සහභාගීවන්නන් ක්‍රියාකළ යුතු අතර ඒවාට හානිදායක වන හෝ නොගැළපෙන අයුරින් කටයුතු කර ඇති විටෙක ඒ පිළිබඳව පැවැත්වෙන විධිමත් විනයානුකූල පරීක්ෂණ ආදියට මුහුණ දීමේ වගකීමට බැඳේ.

Aesthetic Education Branch, MoE

## තරග ශීර්ෂ

## සිසුන් 301ත් 1000ත් අතර පාසල් සඳහා පමණි (301ත් සහ 1000ත් ඇතුළත්ව).

### A කාණ්ඩය

06, 07, 08, 09 ශ්‍රේණි සඳහා තරග

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 01 | ගැහැණු | සමූහ | උඩරට | ගණපති වන්නම |
| තරග අංකය | 02 | පිරිමි | සමූහ | උඩරට | සැවුලා වන්නම |
| තරග අංකය | 03 | මිශ්‍ර | සමූහ | උඩරට | මුසලඩි වන්නම |
| තරග අංකය | 04 | ගැහැණු | සමූහ | පහතරට | සුළු තනි තිතට හා මැදුම් තනි තිතට සරල කවි තාල |
| තරග අංකය | 05 | පිරිමි | සමූහ | පහතරට | මැදුම් තනි තිතට හා මහ තනි තිතට සරල කවි තාල |
| තරග අංකය | 06 | මිශ්‍ර | සමූහ | පහතරට | අනුරාගදණ්ඩ තාලය සින්දු වන්නම |
| තරග අංකය | 07 | ගැහැණු | සමූහ | සබරගමු | ගමන් මාත්‍රය |
| තරග අංකය | 08 | පිරිමි | සමූහ | සබරගමු | සමන්දෙවි මල් අස්න තාලරූප තුනක් ඇතුළත් විය යුතු ය. |
| තරග අංකය | 09 | මිශ්‍ර | සමූහ | සබරගමු | කොවුලා වන්නම |

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 10 | ගැහැණු | සමූහ | නර්තන නිර්මාණ | කුකුල් සමූහයක් |
| තරග අංකය | 11 | පිරිමි | සමූහ | නර්තන නිර්මාණ | කොටි සමූහයක් |

- ඕනෑම චලනයක් භාවිතයෙන් **නිර්මාණාත්මක රංගනයක්** සැකසිය යුතු ය.
- පටිගත කළ සංගීත ඛණ්ඩ පමණක් භාවිත කළ යුතු ය. සංගීත ඛණ්ඩ වාදනය කරවීමට අවශ්‍ය උපකරණ තරගයට ඉදිරිපත් වන පාසල විසින් ම සපයා ගත යුතු ය.
- බාගත කළ සංගීත ඛණ්ඩයක් වුව ද භාවිත කළ හැකි ය.
- කාලය උපරිම විනාඩි 04ක් වන අතර අමතර සමා කාලයක් නොමැත.

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 12 | ගැහැණු | ඒකල | උඩරට වාදනය | මඟුල් බෙර වාදනය (වට්ටම් 1, 2 ඇසුරින්) |
| තරග අංකය | 13 | පිරිමි | ඒකල | උඩරටවාදනය | මඟුල් බෙර වාදනය (වට්ටම් 1, 2 ඇසුරින්) |

Aesthetic Education Branch, MoE

### B කාණ්ඩය

10, 11, 12, 13 ශ්‍රේණි සඳහා

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 14 | ගැහැණු | සමූහ | උඩරට | අස්නෙ |
| තරග අංකය | 15 | පිරිමි | සමූහ | උඩරට | මඩුපුරය සහිත මල්හත් පදය |
| තරග අංකය | 16 | මිශ්‍ර | සමූහ | උඩරට | යක්ඇන්නුම |
| තරග අංකය | 17 | ගැහැණු | සමූහ | පහතරට | නාරිලතා- වෙස් මුහුණු රහිතව |
| තරග අංකය | 18 | පිරිමි | සමූහ | පහතරට | ලිච්ඡවී |
| තරග අංකය | 19 | මිශ්‍ර | සමූහ | පහතරට | කතරගම මල් අස්න |
| තරග අංකය | 20 | ගැහැණු | සමූහ | සබරගමු | සළු පදය |
| තරග අංකය | 21 | පිරිමි | සමූහ | සබරගමු | මුදුන් තාලය |
| තරග අංකය | 22 | මිශ්‍ර | සමූහ | සබරගමු | සේරා වන්නම |
| තරග අංකය | 23 | ගැහැණු | සමූහ | නිර්මාණ | අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය |
| තරග අංකය | 24 | පිරිමි | සමූහ | නිර්මාණ | රබර් කර්මාන්තය (පැළ සිටුවීමේ සිට) |
| තරග අංකය | 25 | මිශ්‍ර | සමූහ | නිර්මාණ | කුඹල් කර්මාන්තය |

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 26 | ගැහැණු | ඒකල | උඩරට | දුනුමාලප්පුව |
| තරග අංකය | 27 | පිරිමි | ඒකල | උඩරට | කෝල්පාඩුව |

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 28 | ගැහැණු | ඒකල | පහතරට | නාග කන්‍යා (සාම්ප්‍රදායික ලී වෙස් මුහුණ සහිතව) |
| තරග අංකය | 29 | පිරිමි | ඒකල | පහතරට | නාගරාක්ෂ (සාම්ප්‍රදායික ලී වෙස් මුහුණ සහිතව) |
| තරග අංකය | 30 | ගැහැණු | ඒකල | සබරගමු | කෙන්ඩි පාලිය |
| තරග අංකය | 31 | පිරිමි | ඒකල | සබරගමු | බිල්ලෙ පාලිය (වෙස් මුහුණ සහිතව) |

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 32 | ගැහැණු | ඒකල | උඩරට වාදනය | තාල රූප තුනක් සඳහා අලංකාර පද යොදා ගනිමින් නිර්මාණාත්මක වාදනයක් |
| තරග අංකය | 33 | පිරිමි | ඒකල | උඩරට වාදනය | තාල රූප තුනක් සඳහා අලංකාර පද යොදා ගනිමින් නිර්මාණාත්මක වාදනයක් |
| තරග අංකය | 34 | ගැහැණු | ඒකල | පහතරට වාදනය | තාල රූප තුනක් සඳහා අලංකාර පද යොදා ගනිමින් නිර්මාණාත්මක වාදනයක් |
| තරග අංකය | 35 | පිරිමි | ඒකල | පහතරට වාදනය | තාල රූප තුනක් සඳහා අලංකාර පද යොදා ගනිමින් නිර්මාණාත්මක වාදනයක් |
| තරග අංකය | 36 | ගැහැණු | ඒකල | සබරගමු වාදනය | තාල රූප තුනක් සඳහා අලංකාර පද යොදා ගනිමින් නිර්මාණාත්මක වාදනයක් |
| තරග අංකය | 37 | පිරිමි | ඒකල | සබරගමු වාදනය | තාල රූප තුනක් සඳහා අලංකාර පද යොදා ගනිමින් නිර්මාණාත්මක වාදනයක් |

**සිසුන් 1001ට වැඩි පාසල් සඳහා පමණි (1001ත් ඇතුළත්ව).**

Aesthetic Education Branch, MoE

## A කාණ්ඩය

**06, 07, 08, 09 ශ්‍රේණි සඳහා තරග**

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 38 | ගැහැණු | සමූහ | උඩරට | ගණපති වන්නම |
| තරග අංකය | 39 | පිරිමි | සමූහ | උඩරට | සැවුලා වන්නම |
| තරග අංකය | 40 | මිශ්‍ර | සමූහ | උඩරට | මුසලඩි වන්නම |
| තරග අංකය | 41 | ගැහැණු | සමූහ | පහතරට | සුළු තනි තිතට හා මැදුම් තනි තිතට සරල කවි තාල |
| තරග අංකය | 42 | පිරිමි | සමූහ | පහතරට | මැදුම් තනි තිතට හා මහ තනි තිතට සරල කවි තාල |
| තරග අංකය | 43 | මිශ්‍ර | සමූහ | පහතරට | අනුරාගදණ්ඩ තාලය සින්දු වන්නම |
| තරග අංකය | 44 | ගැහැණු | සමූහ | සබරගමු | ගමන් මාත්‍රය |
| තරග අංකය | 45 | පිරිමි | සමූහ | සබරගමු | සමන්දෙවි මල් අස්න තාලරූප තුනක් ඇතුළත් විය යුතුය |
| තරග අංකය | 46 | මිශ්‍ර | සමූහ | සබරගමු | කොවුලා වන්නම |

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 47 | ගැහැණු | සමූහ | නර්තන නිර්මාණ | කුකුල් සමූහයක් |
| තරග අංකය | 48 | පිරිමි | සමූහ | නර්තන නිර්මාණ | කොටි සමූහයක් |

- ඕනෑම චලනයක් භාවිතයෙන් **නිර්මාණාත්මක රංගනයක්** සැකසිය යුතු ය.
- පටිගත කළ සංගීත ඛණ්ඩ පමණක් භාවිත කළ යුතු ය. සංගීත ඛණ්ඩ වාදනය කරවීමට අවශ්‍ය උපකරණ තරගයට ඉදිරිපත් වන පාසල විසින්ම සපයා ගත යුතු ය.
- බාගත කළ සංගීත ඛණ්ඩයක් වුව ද භාවිත කළ හැකි ය.
- කාලය උපරිම විනාඩි 04ක් වන අතර සමා කාලයක් නොමැත.

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 49 | ගැහැණු | ඒකල | උඩරට වාදනය | මඟුල් බෙර වාදනය (වට්ටම 1, 2 ඇසුරින්) |
| තරග අංකය | 50 | පිරිමි | ඒකල | උඩරටවාදනය | මඟුල් බෙර වාදනය (වට්ටම 1, 2 ඇසුරින්) |

# B කාණ්ඩය

**10, 11, 12, 13 ශ්‍රේණි සඳහා**

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 51 | ගැහැණු | සමූහ | උඩරට | අස්නෙ |
| තරග අංකය | 52 | පිරිමි | සමූහ | උඩරට | මධුපුරය සහිත මල්හත් පදය |
| තරග අංකය | 53 | මිශ්‍ර | සමූහ | උඩරට | යක්ඇන්නුම |
| තරග අංකය | 54 | ගැහැණු | සමූහ | පහතරට | නාරිලතා- වෙස් මුහුණු රහිතව |
| තරග අංකය | 55 | පිරිමි | සමූහ | පහතරට | ලිච්ඡවී |
| තරග අංකය | 56 | මිශ්‍ර | සමූහ | පහතරට | කතරගම මල් අස්න |
| තරග අංකය | 57 | ගැහැණු | සමූහ | සබරගමු | සළු පදය |
| තරග අංකය | 58 | පිරිමි | සමූහ | සබරගමු | මුදුන් තාලය |
| තරග අංකය | 59 | මිශ්‍ර | සමූහ | සබරගමු | සේරා වන්නම |
| තරග අංකය | 60 | ගැහැණු | සමූහ | නිර්මාණ | අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය |
| තරග අංකය | 61 | පිරිමි | සමූහ | නිර්මාණ | රබර් කර්මාන්තය (පැළ සිටුවීමේ සිට) |
| තරග අංකය | 62 | මිශ්‍ර | සමූහ | නිර්මාණ | කුඹල් කර්මාන්තය |

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 63 | ගැහැණු | ඒකල | උඩරට | දුනුමාලප්පුව |
| තරග අංකය | 64 | පිරිමි | ඒකල | උඩරට | කෝල්පාඩුව |
| තරග අංකය | 65 | ගැහැණු | ඒකල | පහතරට | නාග කන්‍යා (සාම්ප්‍රදායික ලී වෙස් මුහුණ සහිතව) |
| තරග අංකය | 66 | පිරිමි | ඒකල | පහතරට | නාගරාක්ෂ (සාම්ප්‍රදායික ලී වෙස් මුහුණ සහිතව) |
| තරග අංකය | 67 | ගැහැණු | ඒකල | සබරගමු | කෙන්ඩි පාලිය |
| තරග අංකය | 68 | පිරිමි | ඒකල | සබරගමු | බිල්ලෙ පාලිය (වෙස් මුහුණ සහිතව) |

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 69 | ගැහැණු | ඒකල | උඩරට වාදනය | තාල රූප තුනක් සඳහා අලංකාර පද යොදා ගනිමින් නිර්මාණාත්මක වාදනයක් |
| තරග අංකය | 70 | පිරිමි | ඒකල | උඩරට වාදනය | තාල රූප තුනක් සඳහා අලංකාර පද යොදා ගනිමින් නිර්මාණාත්මක වාදනයක් |
| තරග අංකය | 71 | ගැහැණු | ඒකල | පහතරට වාදනය | තාල රූප තුනක් සඳහා අලංකාර පද යොදා ගනිමින් නිර්මාණාත්මක වාදනයක් |
| තරග අංකය | 72 | පිරිමි | ඒකල | පහතරට වාදනය | තාල රූප තුනක් සඳහා අලංකාර පද යොදා ගනිමින් නිර්මාණාත්මක වාදනයක් |
| තරග අංකය | 73 | ගැහැණු | ඒකල | සබරගමු වාදනය | තාල රූප තුනක් සඳහා අලංකාර පද යොදා ගනිමින් නිර්මාණාත්මක වාදනයක් |
| තරග අංකය | 74 | පිරිමි | ඒකල | සබරගමු වාදනය | තාල රූප තුනක් සඳහා අලංකාර පද යොදා ගනිමින් නිර්මාණාත්මක වාදනයක් |

# C කාණ්ඩය

**<u>සිසුන් 300ට අඩු පාසල් සඳහා පමණි.</u>**

(12 සහ 13 ශ්‍රේණි පමණක් පවතින සෞන්දර්ය පාසල්වලට මේ සඳහා ඉල්ලුම් කළ නොහැකි ය. එම පාසල් 301- 1000 අතර පාසල් යටතේ තරග කළ යුතු ය).

**06, 07, 08, 09 ශ්‍රේණි සඳහා තරග**

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 75 | ගැහැණු | සමූහ | උඩරට | ගණපති වන්නම |
| තරග අංකය | 76 | පිරිමි | සමූහ | උඩරට | සැවුලා වන්නම |
| තරග අංකය | 77 | මිශ්‍ර | සමූහ | උඩරට | මුසලඩි වන්නම |

Aesthetic Education Branch MoE

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 78 | ගැහැණු | සමූහ | පහතරට | සුළු තනි තිතට හා මැදුම් තනි තිතට සරල කවි තාල |
| තරග අංකය | 79 | පිරිමි | සමූහ | පහතරට | මැදුම් තනි තිතට හා මහ තනි තිතට සරල කවි තාල |
| තරග අංකය | 80 | මිශ්‍ර | සමූහ | පහතරට | අනුරාගදණ්ඩ තාලය සින්දු වන්නම |
| තරග අංකය | 81 | ගැහැණු | සමූහ | සබරගමු | ගමන් මාත්‍රය |
| තරග අංකය | 82 | පිරිමි | සමූහ | සබරගමු | සමන්දෙව් මල් අස්න තාලරූප තුනක් ඇතුළත් විය යුතු ය |
| තරග අංකය | 83 | මිශ්‍ර | සමූහ | සබරගමු | කොවුලා වන්නම |

10 - 13 ශ්‍රේණි සඳහා තරග

| | | | | | |
|---|---|---|---|---|---|
| තරග අංකය | 84 | ගැහැණු | සමූහ | උඩරට | සුරපති වන්නම |
| තරග අංකය | 85 | පිරිමි | සමූහ | උඩරට | මංගලම් (2+2+2+4+4) |
| තරග අංකය | 86 | මිශ්‍ර | සමූහ | උඩරට | මුසලඩි වන්නම |
| තරග අංකය | 87 | ගැහැණු | සමූහ | පහතරට | ගිරිදේවි |
| තරග අංකය | 88 | පිරිමි | සමූහ | පහතරට | දෙවොල් |
| තරග අංකය | 89 | මිශ්‍ර | සමූහ | පහතරට | ශුද්ධමාත්‍රය |
| තරග අංකය | 90 | ගැහැණු | සමූහ | සබරගමු | පට්ටුතාල මාත්‍රය |
| තරග අංකය | 91 | පිරිමි | සමූහ | සබරගමු | යහන්දැක්ම |
| තරග අංකය | 92 | මිශ්‍ර | සමූහ | සබරගමු | මුල්මාත්‍රය |

06 - 13 ශ්‍රේණි සඳහා විවෘත තරග

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 93 | ගැහැණු | සමූහ | කුරහන් |
| තරග අංකය | 94 | පිරිමි | සමූහ | පතුරු |
| තරග අංකය | 95 | මිශ්‍ර | සමූහ | පන් තෙළිම |

Aesthetic Education Branch, MoE

## D කාණ්ඩය

**ශිෂ්‍ය සංඛ්‍යාව අනුව පාසල් වෙන් වෙන් ව නොව විවෘත එක් කාණ්ඩයක් ලෙස සලකා තරග පැවැත්වේ.**
(සියලු ම රජයේ පාසල්, පිරිවෙන් විද්‍යායතන සහ රජයේ අනුමත පෞද්ගලික පාසල්වලට පමණක් ඉදිරිපත් විය හැකි අතර සියලු ම තරග අංග සඳහා සහභාගි විය හැක්කේ සිසු සිසුවියන්ට පමණි).

**10,11,12,13 ශ්‍රේණි සඳහා ගොක් කොළ ඇසුරින් සැරසිලි හා කැටයම් නිර්මාණය.**

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 96 | ගැහැණු | ඒකල | ගොක් ගෙඩි නිර්මාණය (පහන් නිර්මාණය කළ නොහැකිය). |
| තරග අංකය | 97 | පිරිමි | ඒකල | නිර්මාණාත්මක මල්යහනක ආකෘතියක් |

- කාලය උපරිමය පැය 05කි.
- ස්වභාවික අමුද්‍රව්‍ය භාවිත කළ යුතු අතර අවශ්‍ය සියලු අමුද්‍රව්‍ය සපයා ගත යුතු ය.
- ගොක් ගෙඩි නිර්මාණය සඳහා කම්බි, ස්ටේපර්, ලණු, නූල් ආදී කිසිවක් භාවිත කළ නොහැකි ය.
- නිර්මාණාත්මක මල්යහනක ආකෘතිය :
  - සම්පූර්ණ උස අඩි 5 කි, පළල උපරිම අඩි 3 කි.
  - රාමුව ලී භාවිතයෙන් සැකසිය යුතු ය.
  - පොළව හාරා සිටුවීමට අවස්ථාව නොදෙන අතර, යහන රඳවා ගැනීමට අවශ්‍ය දෑ තරගයට ඉදිරිපත් වන පාසල විසින් සපයා ගත යුතු ය.
  - නිර්මාණයට අදාළ දෑ එම අවස්ථාවේ දී ම සකසා ගත යුතු ය.

- යහන සකස් කිරීමට පමණක් ලණු, නූල් භාවිත කළ හැකි ය.
- විවිධ වර්ණයෙන් යුත් කඩදාසි කොල භාවිත කිරීම තහනම් වන අතර ස්වාභාවික අමුද්‍රව්‍ය පමණක් භාවිත කළ යුතු ය.
- තරග පවත්වන ස්ථානයේ, පාසලට ලබා දෙන වපසරියේ පිරිසිදුකම පිළිබඳ වගකීම එම පාසල සතුවේ. තරගය අවසානයේ තමන් රැගෙන ආ සියලු දේ නැවත රැගෙනයා යුතු ය (මේ සඳහා ද ලකුණු හිමිවේ).

**10,11,12,13 ශ්‍රේණි සඳහා තරග**

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 98 | ගැහැණු | ඒකල | තම්මැට්ටම් කඩිප්පුව සැකසීම |
| තරග අංකය | 99 | පිරිමි | ඒකල | තම්මැට්ටම් කඩිප්පුව සැකසීම |
| තරග අංකය | 100 | ගැහැණු | ඒකල | දවුල් කඩිප්පුවක් නිර්මාණය කිරීම |
| තරග අංකය | 101 | පිරිමි | ඒකල | දවුල් කඩිප්පුවක් නිර්මාණය කිරීම |
| තරග අංකය | 102 | පිරිමි | ඒකල | පහතරට බෙරයක තට්ටුව (සිවිය) දැමීම (බෙරයේ තිබෙන තට්ටු නොව, තරගකරු/තරගකාරිය විසින් රැගෙන ආ නව තට්ටුවක් යෙදිය යුතුය). |
| තරග අංකය | 103 | ගැහැණු | ඒකල | ගැහැණු ශාස්ත්‍රීය නර්තනයක් සඳහා ශීර්ෂාභරණ කට්ටලයක් නිර්මාණය කිරීම (හිසට සහ කණට)<br>මාධ්‍ය සඳහා Rubber Sheet පමණක් භාවිත කළ යුතු ය. |
| තරග අංකය | 104 | පිරිමි | සමූහ | පාරම්පරික සොකරි නාටකය (නූතන වේදිකා නාට්‍ය කොටස් නොවේ). කලාප තරගයේ සිට චරිත සඳහා අදාළ ඇඳුම්, පැළඳුම්, රංග භාණ්ඩ හා පසුතල භාවිත කළ හැකි ය. සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව (ගායනය/වාදනය ඇතුළුව) 15කි. කාලය විනාඩි 10කි. සමා කාලයක් නොමැත. |

- **තරග අංක 98 සිට 103 දක්වා තරග සඳහා කාලය පැය 04කි. අවශ්‍ය අමුද්‍රව්‍ය සපයා ගත යුතු අතර කලින් සකස් කළ අමුද්‍රව්‍ය භාවිත නොකළ යුතු ය.**
- **කඩිප්පු සැකසීමේ දී භාවිත කරන අමුද්‍රව්‍ය නැවීමට රත් කළ යුතු නම් ඒ සඳහා අවශ්‍ය දෑ අදාළ පාසල විසින් සපයා ගත යුතු ය.**
- **ශීර්ෂාභරණ කට්ටලයක් නිර්මාණය කිරීමේ දී බවුත් භාවිත කිරීමට අවස්ථාව නොලැබේ.**
- **නිර්මාණ කටයුතු සඳහා විදුලිබලය සපයනු නොලැබේ.**

Aesthetic Education Branch, MoE

**05 - 13 ශ්‍රේණි සඳහා**

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 105 | පිරිමි | සමූහ | සූවිසි විවරණය (සාම්ප්‍රදායික සූවිසි විවරණය නූතන වේදිකාවට ගැළපෙන පරිදි සකස්විය යුතු අතර ගායනය, වාදනය සහ නර්තනය මනාලෙස සුසංයෝග විය යුතු ය. ප්‍රේක්ෂකයාට අදාළ ගායනා හොඳින් ශ්‍රවණය විය යුතු ය. නර්තන ඉදිරිපත් කිරීමේ දී වේදිකාව හා වේදිකාව ඉදිරිපිට බිම් ප්‍රදේශය මෙන් ම දෙපස පඩි පේළිය වැනි ස්ථාන ද භාවිත කළ හැකි ය. ඒ සඳහා තරග ආරම්භයට පෙර උපරිම විනාඩි පහක් ලබාදේ). රංග වස්ත්‍රාභරණ (සුදු සේලය ඇඳ, ඉනට කළු ලේන්සුවක් බැඳ, හිසට මල සහිත සුම්බරයක්) භාවිත කළ යුතු ය. නර්තනය සඳහා සහභාගී විය හැකි උපරිම සංඛ්‍යාව 24කි. නර්තනයේ යෙදෙන්නන් ම ගායනය කළ යුතු අතර ගායනයට වෙන ම පිරිසක් යොදා නොගත යුතු ය. වාදනය සඳහා තාලම්පට වාදකයා ඇතුළුව උපරිම සංඛ්‍යාව 04කි. කාලය විනාඩි 07ක් වන අතර සමා කාලයක් නොමැත. පිනුම් ගැසීම සපුරා තහනම් වේ. |
| තරග අංකය | 106 | ගැහැණු | සමූහ | පටිගත කරණ ලද සංගීත ඛණ්ඩයකට අනුව පූජාර්ථය දනවන අයුරින් නූතන වේදිකාවට ගැළපෙන පරිදි සැකසූ ප්‍රාසංගික නර්තනයකි. කාලය උපරිම විනාඩි දෙක හමාරකි. සමා කාලයක් නොමැත. රංග වස්ත්‍රාභරණ භාවිත කළ යුතු ය. |

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 107 | පිරිමි | ඒකල | බෙර වාදනය සමග ගායනා ඉදිරිපත් කිරීම. අවම වශයන් තාල රූප 3ක් තිබිය යුතු ය. |
| තරග අංකය | 108 | ගැහැණු | ඒකල | බෙර වාදනය සමග ගායනා ඉදිරිපත් කිරීම. අවම වශයන් තාල රූප 3ක් තිබිය යුතු ය. |

- **107, 108 තරග අංක සඳහා සහායට තාලම්පට වාදකයෙකු යොදා ගත හැකි අතර ඔහුට/ඇයට කිසි විටෙක ගායනය කිරීමට හෝ ගායනයෙන් සහාය වීමට නොහැකි ය.**
- **ඒකල තරගවලට අදාළ අනෙකුත් තරග කොන්දේසි බල පැවැත්වේ.**

**10,11,12,13 ශ්‍රේණි සඳහා මංගල පෝරු සැරසීම සහ චාරිත්‍ර විධි ඉදිරිපත් කිරීම.**

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 109 | පිරිමි | ඒකල | මංගල පෝරු සැරසිලි සහ චාරිත්‍ර |

- **සජීවී ඉදිරිපත් කිරීමකි.**
- **කාලය තරගය පවත්වන දිනයේ දී දැනුම් දෙනු ලැබේ.**
- **ගැළපෙන ඇඳුමින් සැරසී පෝරු සැරසිලි සකස් කළ යුතු ය; චාරිත්‍ර ඉටු කිරීමේ දී ඊට සුදුසු ඇඳුමක් භාවිත කළ යුතු ය.**
- **විනිශ්චය මණ්ඩලය වෙත ගායනා ඉදිරිපත් කළ යුතු ය.**
- **සැරසිලි සඳහා අවශ්‍ය සියලු ම ද්‍රව්‍ය තරගකරු විසින්ම සපයා ගත යුතු අතර පෝරු ආකෘති කිසිවක් භාවිත නොකළ යුතු ය.**
- **පොල්මල් හා පුන්කලස් අවශ්‍ය නොවන අතර, ලබාදෙන ඉඩ ප්‍රමාණයේ සුදු රෙද්දක් එලා අවශ්‍ය සැරසිල්ලක්, තරගකරු විසින් ම සකස් කළ යුතු ය.**

**10,11,12,13 ශ්‍රේණි සඳහා ලී වෙස් මුහුණු නිර්මාණය.**

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 110 | ගැහැණු | ඒකල | ලී වෙස් මුහුණු නිර්මාණය |
| තරග අංකය | 111 | පිරිමි | ඒකල | ලී වෙස් මුහුණු නිර්මාණය |

- **කාලය පැය 06 කි.**
- **අවශ්‍ය සියලුම ද්‍රව්‍ය සපයා ගත යුතු ය.**
- **පහතරට පාලිවලට අදාළ චරිතයක් විය යුතු ය.**
- **ලී කොටයේ සිට වර්ණ ගන්වා නිම වනතුරු තනිව නිර්මාණය සිදු කළ යුතු ය.**

## E කාණ්ඩය

**ජාත්‍යන්තර පාසල් හා එවැනි වෙනත් පෞද්ගලික පාසල් සඳහා පමණි.**
**06 -13 ශ්‍රේණි සඳහා**

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 112 | ගැහැණු | සමූහ | උඩරට - දුනුමාලප්පුව |
| තරග අංකය | 113 | පිරිමි | සමූහ | පහතරට - ශුද්ධ මාත්‍රය |
| තරග අංකය | 114 | මිශ්‍ර | සමූහ | සබරගමු - සිංදු මාත්‍රය |

Aesthetic Education Branch, MoE

# F කාණ්ඩය - විශේෂ තරග

## 10, 11, 12, 13 ශ්‍රේණි සඳහා භරත නාට්‍යම් සහ කථක් නර්තන අංග

- රජයේ පාසල්, පිරිවෙන් විද්‍යායතන සහ රජයේ අනුමත පෞද්ගලික පාසල්වලට පමණක් ඉදිරිපත් විය හැකි ය.
- මෙම තරගය ඉහත සඳහන් තරගවලට අමතරව විශේෂ තරගයක් ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ම පවත්වනු ලැබේ.
- 1.1.3, 1.1.4 සහ 1.1.5 යන කොන්දේසිවල සඳහන් සහභාගී විය හැකි තරග අංක සංඛ්‍යාවට අමතරව <u>එක් පාසලකට</u> තරග අංක **115 -124 දක්වා භරත නාට්‍යම් සහ කථක්** නර්තන තරග අංක යටතේ අදාළ ඕනෑම තරග අංක 02කට පමණක් සහභාගී විය හැකි ය.
- මෙහි දී සඳහා පාසල් ශිෂ්‍ය සංඛ්‍යාව අනුව වෙන් වෙන් වශයෙන් තරග නොපැවැත්වේ.
- **2023** වර්ෂයේ දී **<u>භරත නාට්‍යම් සහ කථක් නර්තන තරගය</u>** - ඒකල තරගවලින් ප්‍රථම ස්ථානය ජයග්‍රහණය කරන ලද පාසල්වලට එම තරග අංකයෙන් ම ඉදිරිපත් විය නොහැකි ය.
- අවසන් තරග පැවැත්වීම සඳහා වෙන ම දිනයක් දන්වනු ලැබේ.
- **දමිළ මාධ්‍ය පාසල්වලට සහභාගී විය නොහැකි ය.**
- ගායන-වාදන සඳහා පටිගත කිරීම් මගින් හෝ සජීවීව ඉදිරිපත් විය හැක. ගායන, වාදන සහ සංගීතය සඳහා විශේෂ ලකුණක් හිමි නො වේ. කාල වේලාව අනිකුත් තරගවලට අදාළ පරිදි ම වේ.

Aesthetic Education Branch, MoE

### <u>භරත නාට්‍යම් තරග</u>

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 115 | ගැහැණු | සමූහ | අලාරිප්පු (චතුශ්‍ර) |
| තරග අංකය | 116 | පිරිමි | සමූහ | තිල්ලානා (ආරබි) |
| තරග අංකය | 117 | මිශ්‍ර | සමූහ | පදම් |

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 118 | ගැහැණු | ඒකල | කෞවුත්තම් (මුරුගන් කෞත්තම්) |
| තරග අංකය | 119 | පිරිමි | ඒකල | නඩේෂ් කෞවුත්තම් |

### <u>කථක් නර්තන තරග</u>

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 120 | ගැහැණු | සමූහ | චතුරංග |
| තරග අංකය | 121 | පිරිමි | සමූහ | කවිත්ත මිශ්‍ර කරගත් කථක් නර්තනයක් |
| තරග අංකය | 122 | මිශ්‍ර | සමූහ | ගZසල් |

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 123 | ගැහැණු | ඒකල | ඨුම්රි |
| තරග අංකය | 124 | පිරිමි | ඒකල | භජන් |

### <u>මාර්ගගත තරග අංශය</u>

| | | | | |
|---|---|---|---|---|
| තරග අංකය | 125 | ගැහැණු | ඒකල | නාගයා |
| තරග අංකය | 126 | පිරිමි | ඒකල | අශ්වයා |

- මාර්ගගත ක්‍රමයට ඉදිරිපත් කළ යුතු ය. කාලය විනාඩි 03කි.
- ඕනෑම වයස් කාණ්ඩයක සිසු-සිසුවියන් ට ඉදිරිපත් විය හැකිය.
- තරගකරු/තරගකාරිය විසින් ම සකසාගත්, පටිගත කරන ලද සංගීතය යොදාගත යුතු ය. අවශ්‍ය තාක්ෂණික උපකරණ සහභාගීවන්නන් විසින්ම සපයාගත යුතු ය.
- විශේෂයෙන් සකස් කළ පසුතල සහ රංග භාණ්ඩ භාවිත කළ නොහැකි අතර රංග වස්ත්‍රාභරණ භාවිත කළ හැකි ය.
- අඛණ්ඩව රූගත කෙරුණු සහ සංස්කරණය නොකළ වීඩියෝවක් (Full HD Video.file format mp4) Google Drive වෙත උඩුගත (Upload) කර, එහි සබැඳිය සහ අයදුම්පතේ PDF පිටපතක් aestheticeducation.moe.lk @gmail.com යන ඊ මේල් ලිපිනයට එවිය යුතු ය. එම සබැඳිය ක්‍රියාකාරී සහ අදාළ වීඩියෝවට ප්‍රවේශ වී එය විවෘත වනසුලු ප්‍රමිතියෙන් යුතු වීම අනිවාර්ය ය.
- එම ඊ මේල් පණිවිඩයේ "Subject" හෙවත් මාතෘකා ශීර්ෂය "Dancing 2024-Special Events" යතුවෙන් සටහන් කළ යුතු ය.
- මුල්පිටපත ලියාපදිංචි තැපෑලෙන් අංක 2.1.5 හි සඳහන් ලිපිනයට 2024 අප්‍රේල් 10 දිනට පෙර එවිය යුතු ය.

**මෙම තරගයට ඉදිරිපත් වන සියලු ම තරගකරුවන් සහ අනෙකුත් පාර්ශවකරුවන් තරගයේ සෑම අවස්ථාවක ම මෙම තරග චක්‍රලේඛයේ සඳහන් සියලු නීති රීති පිළිපැදීමටත්, විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වශයෙන් පිළිගැනීමටත් බැඳී සිටී.**

Aesthetic Education Branch, MoE

අයදුම්පත

# සමස්ත ලංකා පාසල් නර්තන තරගය - 2024

| | |
|---|---|
| ශිෂ්‍ය සංඛ්‍යාව 300ට අඩු | |
| ශිෂ්‍ය සංඛ්‍යාව 301-1000 අතර | |
| ශිෂ්‍ය සංඛ්‍යාව 1001 සිට | |
| ජාත්‍යන්තර පාසල් හා එවැනි වෙනත් පෞද්ගලික පාසල් | |

01. පාසල අයත් කලාපය :- ................................ පළාත :- ..............................

02. පාසලේ නම සහ ලිපිනය :- ..........................................................................................
..........................................................................................

03. පාසලේ දුරකථන අංකය :-

| තරග ශීර්ෂ අංකය | තරගයේ නම |
|---|---|
| | |

| අනු අංකය | ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම | උපන් දිනය | ඉගෙන ගන්නා ශ්‍රේණිය | විදුහල්පති ඉදිරියේ අත්සන | තරග මණ්ඩලය ඉදිරියේ අත්සන |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

04. ගායනය සඳහා සහභාගිවන්නන්

| අනු අංකය | නම | පාසලේ නම | ශ්‍රේණිය | හැඳුනුම්පත් අංකය | අත්සන |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

05. වාදනය සඳහා සහභාගිවන්නන්

| අනු අංකය | නම | පාසලේ නම | ශ්‍රේණිය | හැඳුනුම්පත් අංකය | අත්සන |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

06. ප්‍රසංග අංග පුහුණු කළ ගුරුභවතුන්

| අනු අංකය | නම | පාසලේ නම | හැඳුනුම්පත් අංකය | දුරකථන අංකය | අත්සන |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

ඉහත සඳහන් සිසුන් අප විද්‍යාලයේ අදාළ ශ්‍රේණිවල ඉගෙන ගන්නා බවත්, අප විද්‍යාලයේ දැනට සිටින ශිෂ්‍ය සංඛ්‍යාව ...............ක් බවත්, චක්‍රලේඛය අනුව අදාළ සිසුන් මා ඉදිරියේ අත්සන් කළ බවත්, සහතික කරන අතර, චක්‍රලේඛයේ සඳහන් කරුණුවලට අනුව තරගය සඳහා ඉදිරිපත් කිරීම නිර්දේශ කරමි.

විදුහල්පතිගේ අත්සන :-

නිලමුද්‍රාව :-

දිනය :-